ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

Article 11

| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2019 - 08 - 08 |
|---|---|---|

පැමිණිලිකරු : එස්.කේ.සි.කුමාරසිරි මයා,
140 ඩී, කදුබොඩ,
දෙල්ගොඩ.

වගඋත්තරකරුවන් : 01. ප්‍ර.පො.ප. එන්.කේ.ඒ.කේ.අයි.වික්‍රමසිංහ මයා,
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
මීගහවත්ත.

02. ස්ථානාධිපති,
සුළු පැමිණිලි අංශය,
පොලිස් ස්ථානය,
මීගහවත්ත.

<u>පැමිණිලි අංකය : HRC/4339/15</u>

පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම :-

ඉහත නම් සදහන් පැමිණිලිකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පැමිණිල්ලක් ගොනු කරමින් සදහන් කර ඇත්තේ 2015.11.23 වන දින මීගහවත්ත පොලිස් ස්ථානයට පැමිණෙන ලෙසට කරන ලද දැනුම්දීමක් මත තමා පස්වරු 3.15ට පමණ පොලිස් ස්ථානයට ගිය බවත්, එහිදී තම අසල්වැසියෙකු වූ චම්පා බෝගොඩ යන අය විසින් 2015.11.21 වන දින හෝ ඊට ආසන්න දිනක සිදුවූ පුද්ගලික ආරවුලක් සම්බන්ධයෙන් ගොනු කර තිබූ පැමිණිල්ලක් විභාග කිරීම සදහා කැඳවීම් කර ඇති බව දැනගත් බවත් අදාළ පැමිණිල්ල විභාග කිරීම සදහා පොලිස් ස්ථානාධිපතිවරයා වෙත යොමු කළ බවත්ය. පොලිස් ස්ථානාධිපතිවරයා විසින් තමා හට බැණවැදි "උඹ තමයි මේ සේරම කරලා තියෙන්නේ" යැයි කියා අනෙක් පාර්ශවය ඉදිරිපිටදී තමාගේ පපු ප්‍රදේශයට පහර කිහිපයක් ගැසූ අතර, එක් පහරක්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com

වැළැක්වීමට යාමේදි වම් අතේ මැණික් කටුව අසලින් අත බිදී යාමකට ලක් වූ බවද දන්වා ඇත. ඒ අනුව පැමිණිලිකරු ඉල්ලා සිට ඇත්තේ, තමාට සිදුවූ අසාධාරණය හා හානිය සම්බන්ධයෙන් මෙම පක්ෂග්‍රාහිව කටයුතු කරනු ලැබූ ස්ථානාධිපතිවරයා සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර තමාගේ අයිතිවාසිකම් කඩවූ බවට නිර්දේශයක් ලබා දෙන ලෙසය.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

මීගහවත්ත පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරමින්, අංක 140, කදුබොඩ දෙල්ගොඩ ලිපිනයේ පදංචි චම්පා බෝගොඩ යන අය විසින් 2015.11.21 වන දින සි.අයි.බි. 1 - 325/198 යටතේ මරණීය තර්ජණයක් සිදු කිරිම සම්බන්ධයෙන් පැමිණිල්ලක් ගොනු කර ඇති බවත්, ඒ අනුව පො.සැ. 65207 පාරිස් නැමති නිලධාරියා විසින් මූලික පරික්ෂණයක් පවත්වා 2015.11.23 වන දින වැඩිදුර විභාග කිරිම සදහා පැය 15.00 ට තමා වෙතට දෙපාර්ශවය යොමු කළ බවත් සඳහන් කර ඇත. තමා පැමිණිල්ල විභාග කරන අවස්ථාවේදිද මෙම කුමාරසිරි යන අය පැමිණිලිකාරියට මරණීය තර්ජණ සිදු කරන ලද බවත් එම අවස්ථාවේදි සුළු පැමිණිලි අංශයේ පො.කො. 85895 ජයශාන්ත යන නිලධාරියා එහි සිටි බවත් සඳහන් කර ඇත. මේ සම්බන්ධව තමා විසින් පොලිස් නිලධාරියකු ඉදිරිපිට සාමය කඩවන ලෙස හැසිරිම සම්බන්ධයෙන් වරද කියා දි පැය 16.30 ට අත්අඩංගුවට ගත් බවත් පසුව සි.අයි.බි. 1 - 347/220 යටතේ සටහන් යොදා 2015.11.24 වන දින නඩු අංක 4618/15 යටතේ මහර අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත් පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරනු ලබන පහරදිමේ චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත් ප්‍රකාශ කර ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභා විමර්ශණයේදි අනාවරණය වී ඇති කරුණු :-**

මෙම පැමිණිලිකරු හා යාබද නිවසේ නිවැසියන් අතර ඉඩමේ වැසි ජලය බැස යාම සම්බන්ධව ආරවුලක් නිර්මාණය වී ඇති අතර, මෙම ආරවුල සම්බන්ධයෙන් බියගම ප්‍රදේශිය සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් වීම මත විමර්ශනයක් ද සිදු කර ඇති බවද නිරික්ෂණය වේ. තවද එම වැසි ජලය බැස යාම සම්බන්ධයෙන් නැවත වරක් 2015.11.21 වන දින ඇති වූ ආරවුල මත අසල්වැසි කාන්තාව විසින් 2015.11.21 වන දින සි.අයි.බි 1 - 325/198 යටතේ පැමිණිල්ලක් ගොනු කර ඇති බවද නිරීක්ෂණය වේ.

2015.11.22 වන දින මිගහවත්ත පොලිස් ස්ථානයේ පොලිස් සැරයන් 65207 පාරිස් යන නිලධාරියා විසින් ස්ථානීය පරික්ෂණයක් සිදු කර ඇති අතර, දෙපාර්ශවය 2015.11.23 වන දින සවස 3.15 ට පොලිස් ස්ථානය වෙත කැදවා ඇති බවටද ලේඛන පරික්ෂා කිරිමේදි තහවුරු වේ. ඒ අනුව දෙපාර්ශවයම 2015.11.23 දින පොලිස් ස්ථානය වෙත ගොස් ඇති අතර එහිදි පොලිස් ස්ථානාධිපති විසින් පැමිණිල්ල

විමර්ශනය කිරිම සිදු කර ඇති බව හා පැමිණිල්ල විමර්ශනය කිරිමේදි එම ස්ථානයේදි යම් ආරවුල් තත්වයක් නිර්මාණයවී තිබෙන බව දෙපාර්ශවය විසින්ම කරනු ලැබූ ඉදිරිපත් කිරිම් වලින් තහවුරු වේ. මෙම පැමිණිලිකරු 2015.11.23 වන දින පොලිස් ස්ථානයට යන අවස්ථාවේදි ඔහුගේ ඥාති සොහොයුරකු වන 209/01 නව නුවර පාර, බියගම ලිපිනයේ පදිංචි නාරංගොඩ ලියනගේ දොන් අතුල සොලමන් බණ්ඩාර යන අය ද ගිය බවට ඔහු විසින් දිවුරුම් ප්‍රකාශයක් මගින් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත. ස්ථානාධිපතිවරයා විසින් අත දිග හරිමින් මෙම පැමිණිලිකරුට බැණ වදින අයුරු හා ස්ථානාධිපතිවරයා පැමිණිලිකරු ඉදිරියට පැමිණ පහර කිහිපයක් ගසන අයුරු තමා දුටු බවටද වැඩිදුරටත් එම දිවුරුම් ප්‍රකාශයේ සදහන්ව ඇත. ඊට අමතරව පැමිණිල්ලේ කරුණු සනාථ කිරිම සදහා තවත් සාක්ෂි ලෙස දිවුරුම් ප්රකාශ 4 ක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

මෙම පැමිණිලිකරු 2015.11.25 වන දින රාගම ජාතික රෝහලෙන් නේවාසිකව ප්‍රතිකාර ලබාගෙන ඇති අතර 2015.11.29 වන දින අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු විසින් පරික්ෂා කර ඇත. ඒ අනුව කොමිෂන් සභාව විසින් අධිකරණ වෛද්‍ය වාර්තාව කැදවා ඇති අතර, අධිකරණ වෛද්‍ය නිලධාරි වෛද්‍ය කේ.පි.එස්.බණ්ඩාර මහතා විසින් අධිකරණ වෛද්‍ය වාර්තාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එම වෛද්‍ය වාර්තාවට අනුව මෙම පැමිණිලිකරුගේ තුවාල 03ක් තිබෙන බවට කරුණු ඉදිරිපත් කර ඇත. ඉන් එක් තුවාලයක් වම් අතේ මැණික් කඩුව ආසන්නයේ අස්ථි බිදුමක් වන බවත් (එය X කිරණ 93070 මගින් තහවුරු කර ඇත) අනෙක පපුව (ඉදිරිපස) ශරිරයේ මධ්‍ය කොටසට විමට 3 X 2 cm ප්‍රමාණයේ අව්ධිමත් හැඩයේ තැලිම් කැළලක් තිබෙන බවට ද සටහන් කොට ඇත. එසේම එම සිදුවී ඇති තුවාල පැමිණිලිකරු දක්වන පහරදීම් කළ ආකාරය හා සැසදේ.

නිගමනය :-

මෙම සමස්ථ කරුණු කෙරෙහි අවධානය කිරිමේදී පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ ගොනු කර ඇති පැමිණිල්ලෙන් ප්‍රකාශ කරන පරිදි උක්ත වගඋත්තරකරු විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරිමකට ලක් කර ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

නිර්දේශය :-

01. පළවන වගඋත්තරකරු වන ප්‍ර.පො.ප එන්.කේ.ඒ.කේ.අයි වික්‍රමසිංහ යන අය විසින් පැමිණිලි පාර්ශවය වෙත රු. 50,000/- ක මුදලක් ගෙවීමට කටයුතු කළ යුතුය.

02. වගඋත්තරකරු සම්බන්ධයෙන් සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පති, සහ පොලිස් කොමිෂන් සභාව වෙතද යොමු කරනු ලැබේ.

2019. 09 - 09 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත් :- 1. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

2. සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

B/ සැ:යු - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මඟින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සළස්වන්න.